නමෝ බුද්ධාය

දාහ නව වෙනි වෙළුම
ආරම්භය: 2001-07-05

මාසික ධර්ම සංග්‍රහය අංක: 182

ශ්‍රී. බු. ව. 2559 | 2015 ජූලි 31 | ඇසළ කලාපය

# රටක් පාලනය කළ යුත්තේ කෙසේද?

කොළඹ ආනන්ද විද්‍යාලයේ ධර්මාචාර්ය,

**අතිපූජ්‍ය වේපතඉර හේමාලෝක හිමිපාණන් වහන්සේ විසිනි**

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස ///

"දානං සීලං පරිච්චාගං - අජ්ජවං මජ්ජවං තපං
අක්කොධො අවිහිංසා ච - ඛන්තී ච අවිරෝධතා"

(ජාතක පාලිය)

සැදැහැවත් පින්වතුනි,

අද ධර්ම දේශනාවේ මාතෘකාව වශයෙන් තබා ගත්තේ මහා හංස ජාතකයෙහිත් , සකුණ ජාතකයෙහිත් සඳහන් රාජ ධර්මය පිළිබඳ දක්වන දස රාජ ධර්ම වලට අයත් ගාථා ධර්මයකි.

මෙම දසරාජ ධර්ම පිළිබඳ විග්‍රහ කරන්න ඉස්සර රාජ්‍ය සංකල්ප ගැන කරුණු කිහිපක් ප්‍රකාශ කළ යුතුව තිබෙනවා. රජකම පිළිබඳ බුදුරජාණන් වහන්සේ මුලින්ම දේශනා කරණ ලද්දේ " අග්ගඤ්ඤ"සූත්‍රයේ රජකම උරුම වූයේ හදිසියේ නොවෙයි. එය ක්‍රමානුකූලව උරුම වූවක් බව ඉන් පැහැදිලි වෙනවා. මිනිසාගේ ප්‍රශ්න විසඳා ගැනීමට මිනිසා විසින්ම ගොඩ නගාගත් සංවිධානයක් ලෙස රජකම හඳුන්වන්න පුළුවනි. පෞද්ගලික දේපළ භුක්ති විඳීමේදී මහජනයා අතර ඇතිවූ ගැටලු විසඳා ගැනීමට මහජන සම්මතයෙන් පත් කර ගත් පුද්ගලයා "මහා සම්මත" යනුවෙන් හඳුන්වා ඇති බව සූත්‍ර ධර්මවල මෙන්ම බ්‍රාහ්මණ මත වල ද දැක්වෙනවා.

මේ දස රාජ ධර්ම වලින් සිදු කරන්නේ ඒ මහජන මතයෙන් පත් කළ පුද්ගලයා කෙබඳු ද කියන එක පැහැදිලි කර දීමක්. ඔහුගේ ක්‍රියා කලාපය කෙසේ විය යුතුදැයි පැහැදිලි කර දීමක්.

වර්තමානයේ මේ රජකම් කරන පුද්ගලයන් ළඟ මේ ගුණ ධර්ම තිබෙනවා ද යන්න ද පින්වතුනි සොයා බැලිය යුතුයි. මුලින්ම දස රාජ ධර්ම වල පළමු වන රාජ ධර්මය වන්නේ දානයයි. බුදුරජාන් වහන්සේ දානය පිළිබඳ නොයෙක් තැන්වල

දේශනා කරන දස පාරමිතා වලත් මුලින්ම දක්වන්නේ දානය ගැන. ඒවාගේම සතර සංග්‍රහ වස්තු වලත් දක්වන්නේ දානය ගැන. රජ කෙනෙක් දන්දෙන කෙනෙක් වෙන්න ඕන. ජනතාව පැත්තෙන් බැලුවම රජු ප්‍රිය මනාප පුද්ගලයෙක් වෙන්න ඕන. ප්‍රිය මනාප පුද්ගලයෙක් වීමට දානය ඉතා අවශ්‍ය වන බව **"දදං පියෝහොති භජනති නං බහූං"** යන ගාථාවෙන් ද උගන්වනවා. දීම ප්‍රිය මනාප වීමට පමණක් නොවෙයි. බොහෝ දෙනා ඇසුරු කිරීමට ද හේතුවන බව එම ගාථාවෙන් උගන්වනවා. රජකුට අවශ්‍ය වන්නේ ප්‍රිය මනාපත්වය, බොහෝ අය ඇසුරු කිරීම, කීර්තිය පැතිරීම, යසස වැඩීම යන කාරණායි. දානය මේ කරුණු සම්පූර්ණ කරන උතුම් දෙයක් ලෙස දක්වන්න පුළුවන්. සමාජයේ හොඳ රජෙක් වන්න මේ කරුණු සම්පූර්ණ කර ගත යුතුයි. ඉන්දියාවේ රජ කළ ධර්මාශෝක මහාධිරාජයා ළඟ මේ උතුම් ගුණය තිබූ බව සඳහන් කරන්න පුළුවන් වෙනවා.

හොඳින් රාජ්‍ය පාලනය කරන රජෙක් ලඟ තිබිය යුතු උතුම් දෙවන ගුණාංගය සීලය ලෙස සඳහන් වෙනවා. කය වචන සංවර සීලය වශයෙන් **"කාය වාචානං සමෝදානං සීලං"** යනුවෙන් සඳහන් කරනවා. කයින් සිදුවන අකුසල් වන්නේ ප්‍රාණ ඝාතය, අදත්තාදානය, කාම මිත්‍යාචාරය යන කරුණුයි.

අද වර්තමානයේ රජෙක් මේ කරුණු වලින් යුක්තව රට පාලනය කරනවාද යන්නද විමසා බලන්න ඕන. එසේ විමසන විට අපේ බොහෝ තැන්වල සත්ව ඝාතක මඩු දැකිය හැකි නේද? ඒ විතරක් නොවෙයි සතුන් මරා ප්‍රදර්ශනය කරමින් පාර අයිනේ දකින්න ලැබෙනවා. බෞද්ධ රටක් වශයෙන් නොවෙයි සත්ව ඝාතක රටක් වශයෙන් ඒ තුළින් දිස් වෙන අවස්ථා ද තිබෙනවා.

හොරකම ඉතාම ඉහළින් අද රජවෙලා. රටක හොරකම, කරන ඇමතිවරු, මන්ත්‍රීවරු ඕන තරම් දැකිය හැකියි. ඒවා කිසි ලැජ්ජා භයක් නැතිව සිදු කරනවා. පාලකයෝත් ඒවාට අනුබල දෙන්නාක් මෙන් නිහඬ ප්‍රතිපත්ති ගරු කරමින් ජීවත් වෙනවා. එයින් පේන්නේ ඔවුන් මේවා අනුමත කරන බව නේද? රාජ්‍ය දේපළ වලට කරන හොරකම අද ඉතා විශාල ලෙස ඉහළ ගිහින්.

සිල්වතෙක් වීමට ඊළඟට අවශ්‍ය වන්නේ කාම මිත්‍යාචාරයෙන් ඈත් වීමයි. රටේ හැම තැනම බලපත් ඇති නැති ගණිකා නිවාස අද දැකිය හැකියි. බලපත් ඇති නිවාස ඒවාට වැඩිය නැති නිවාසයි තිබෙන්නේ. එසේම මත්පැන් හල්. මේ වර්තමානයේ තරම් මත්පැන් හල් වැඩි වූ රටක් ලෝකයේ ම නොදැකිය හැකි වෙනවා. නගරයක අරක්කු තැබෑරුම් කොපමණ තිබෙනවාද? දැහැමිව රජ කරන රටක මේවා තිබිය හැකිද? පාලකයන් අද පාටි නොදමන හමුවක් තිබෙනවාද? මැති ඇමතිවරු සමඟ එකතු වුවත්, හිතවතුන් සමඟ එකතු වුවත්, එය අවසන් වන්නේ මධුවිත ඇති පදමට ගැනීමෙන්. මේ සියල්ල අයත් වන්නේ කාම මිත්‍යාචාරයට යි.

වචනය සංවර වීමද සීලයට අයත් වන කාර්යයක්. බොරුකීම, කේළාම්

කීම,. හිස් වචන කතා කිරීම, පරුෂ වචන කීම යන කරුණු වලින් මිදුනහොත් පමණයි වචනය සංවර කර ගත්තා වෙන්නේ. අද බොරුව රජ වෙලා. ලංකාවේ තරම් වෛතීය රජවරු වෙනත් රටවල දක්නට ලැබෙන්නේ නැහැ. එසේ කියන්නේ බොරුව රජ වී ඇති බව දක්වන්න. ඡන්ද කාලයේ මොනතරම් බොරු පොරොන්දු ජනතාව හමුවේ තබනවාද? ඒවා රසකර කියන ආකාරය මහජනයා අසා සිටිනවා. ජනතාව සුඛිත මුදිත කරන්න කතා කරනවා. මේ සියලු බොරු වලින් ජනතාව රවටලා ඡන්දය ගන්නවා. ඡන්දය අරගෙන රජ වෙලා ඊටත් වඩා බොරු පොරොන්දු දෙනවා. බොරු කරනවා. රටක් නොදියුණු වෙන්න එකම හේතුව මෙවන් ක්‍රියා කලාප බව හොඳින් පෙනී යනවා.

රටක දුගී දුප්පත් ජනතාව නඟා සිටුවීම පාලකයන්ගේ යුතුකමක් ලෙස දක්වන්න පුළුවන්. එය දස රාජ ධර්ම වල "පරිත්‍යාගය" වශයෙන් දක්වා තිබෙන්නේ. සුබසාධන ක්‍රියා වශයෙන් මේවා හඳුන්වනවා. අප රටේ සුබසාධන කටයුතු වලින් පචා හොරකම් කරන එකයි අපට දක්නට ලැබෙන්නේ. විශේෂයෙන්ම අප රට දුප්පත් රටක්, රටට ඔරොත්තු දෙන පරිත්‍යාග ක්‍රමයක් තිබිය යුතුයි. එය පාලකයන්ගේ වගකීමක්. දුප්පත් මිනිසුන්ගේ දුක හඳුනාගෙන ඒ දුකට පිහිට විය යුතු වෙනවා. එසේම ධනවත් පුද්ගලයන්ගෙන් ඉල්ලා බුදු සමයේ උගන්වන ආකාරයට පරිත්‍යාග කළ යුතු වෙනවා.

කෙළින් තීරණ ගැනීම රටක පාලකයෙක් කළ යුතු දෙයක්. දස රාජ ධර්ම වලදී එය ඉතා වැදගත් කරුණක් ලෙසත් දක්වා තිබෙනවා. "අජ්ජවං" යනුවෙන් දක්වන්නේ එයයි. එය ඍජු බව වශයෙන් සඳහන් කළ හැකිය. නිවැරදි තීරණ ගැනීම් මේ කාලයේ හැටියට ඉතා වැදගත්. එවැනි රජවරු සිටිනවා යයි අසන්නට ලැබීමද භාග්‍යක් කොට සලකන්න පුළුවන්. අද අප භුක්ති විඳින්නේ නිදහසින් පසු බිහිවූ අපේ පාලකයින් නිවැරදි තීරණ නොගැනීමේ පලවිපාක බවද සඳහන් කරන්න වෙනවා. එසේම බලන්න මේ රටේ හරියට නීතියක් ක්‍රියාත්මක වෙනවාද කියලා. නීති පොතට පමණයි සීමා වී තිබෙන්නේ. ඇතැම් නීති ක්‍රියාත්මක වන්නෙ අහිංසක පුද්ගලයින්ට පමණයි. බලවතුන්ට ධනවතුන්ට නීති ක්‍රියාත්මක වන්නේ නැහැ. මෙය රටක පරිහානියට බෙහෙවින් බලපානවා. පාලකයාගේ ඍජු ප්‍රතිපත්තියක් නොමැතිකම මෙයට හේතුව ලෙස දක්වන්න පුළුවන්.

මෘදු බව ද දස රාජ ධර්මවල තවත් කරුණක්. ඍජු ගුණය මෙන්ම මෘදු ගුණයද තිබිය යුතුයි. හදවත් උණුවන ගුණය ලෙසද මෙය දැක්විය හැකි වෙනවා. මෘදු ගුණය සමඟ ගමන් කරන තවත් කරුණක් තමයි "තපස". ඉන් හඳුන්වන්නේ හික්මුණු ස්වාභාවයයි. දුරදිග බලා කටයුතු කිරීමයි. පැසුණු බුද්ධියද මෙහිදී විශේෂයෙන් තපස් චර්යාවක් ලෙස දැක්විය හැකි වෙනවා.

ඊළඟ කාරණය වන්නේ "අක්කොධය" යන්නයි. ක්‍රෝධ නොකිරීම මින් අදහස් කරන්න පුළුවන්. දේශපාලන වශයෙන් මෙයද අප රටේ බහුලව දැකිය හැකි

වෙනවා. තම පක්ෂය බලයට පත් වූ විට තමාට වැඩ නොකරපු උදව් නොකරපු තැනැත්තාගෙන් පලි ගැනීම කුමන පක්ෂයක් බලයට පත් වුවත් දැකිය හැකි කාරණයක්. වෛරය ලෙසද මෙය විග්‍රහ කළ හැකි වෙනවා.

දස රාජ ධර්මවල ඊළඟ කරුණ "අහිංසාව" යි. සියලු සතුන් තමන්ගේ යන වග දැන ගෙනඅහිංසක ප්‍රතිපත්තියක් රට තුළ ක්‍රියාත්මක කළ යුතු වෙනවා. ප්‍රාණ ඝාතයෙන් තොරව කටයුතු කිරීම අහිංසාවේ ඉතාම උස් ගුණාංගයක් ලෙස සඳහන් කළ හැකියි.

රටක් පාලනය කරන විට විරුද්ධ කරුවන් බහුල වීමද දැකිය හැකි කරුණකා. පාලනය බලය ගැනීඹමට සිටිනා පුද්ගලයින් නොයෙක් විරුද්ධ කම් කරනවා. එහිදී තමා ළඟ තිබිය යුතු මහඟු ගුණාංගයකි: "ඛන්ති" හෙවත් ඉවසීම, බෝධි සත්ව පාරමිතාවක් වශයෙන්ද මෙය හඳුන්වා තිබෙනවා. අධික කෝපය විනාශයට මුල් වන බව බඉතා පැහැදිලි කරුණක්.

එසේම ඊළඟ කරුණ වශයෙන් විරුද්ධ නොවීම "අවිරෝධතා" යන්නෙන් දසරාජ ධර්ම වලදී හඳුන්වනවා. අන්‍ය මත ගරු කිරීමද මෙයින් අදහස් වෙනවා. රජකම් කරන විට නොයෙක් දෙනාගේ මතවලටද අහුම්කන් දීම සිදු කළ යුතු දෙයක්. එය විරුද්ධ නොවීම වශයෙන් සඳහන් කළ හැකියි.

මේ අනුව බලන විට යම් රටක රාජ්‍ය පාලකයෙක් මේ බුදුරජාණන් වහන්සේ දේශනා කළ දස රාජ ධර්ම වලට අනුව රට පාලනය කරන්නේ නම් හෙතෙම ශ්‍රේෂ්ඨ පාලකයෙක් වශයෙන් ද එම රට දැහැමි රටක් වශයෙන් ද පෙන්වා දිය හැකි වෙනවා.

**ඔබ සැමට සම්මා සම්බුදු සරණයි !**